678.4.663.541

# සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට මග පෙන්වන කරුණු

අ. බ. දිසානායක විසිනි.

(ප්‍රධානියා, උපදේශක සේවා දෙපාර්තමේන්තුව සහ ආර්ථික පර්යේෂණ අංශය)

## අ. සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන පාලනය කිරීම

1. සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන පාලනය ඡන්දයෙන් පත්වූ කමිටුවකින් විය යුතුය. එම කමිටුවට ප්‍රදේශයේ රබර් උපදේශක තැන හා ප්‍රාදේශීය උපදේශක තැන නිල බලයෙන්ම ඇතුලත් විය යුතුය. පාලන කමිටුවේ තනතුරු සාමාන්‍යයෙන් සුළු ඉඩම් හිමියන් විසින්ම දැරිය යුතුය.

2. එම කමිටුව වසරකට කමිටු රැස්වීම් 11 ක් හෝ අඩුම වශයෙන් 6 ක් හෝ පැවැත්විය යුතු අතර, වාර්ෂික මහා සභා රැස්වීමක්ද පැවැත්විය යුතුය. සෑම වසරකදීම වාර්ෂික මහා සභා රැස්වීමේදී නිලධාරි මණ්ඩලය තෝරා පත්කර ගත යුතුය. මධ්‍යස්ථානයේ සාමාජිකයන්ගෙන් සියයට 33කට නො අඩු සංඛ්‍යාවකගේ කැමැත්ත අනුව විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැක.

3. මධ්‍යස්ථානයේ ඇති රබර් රෝල්, බාල්දි, කිරි මුදවන තැටි, මැට්‍රොලැක් උපකරණ ආදිය ඇතුලත් බඩු ලේඛණයක් තබා ගත යුතුය. ණයට ගත් බඩු බාහිරාදියද, ණයට ගත් ඒවා ලෙසට එහි වෙනම සටහන් තබා ගත යුතුය.

4. සාමාජිකයන් තමන්ගේ කිරි මධ්‍යස්ථානයට ගෙනවිත් භාර දිය යුතුය. එම ප්‍රමාණය කොතෙක්දැයි 'මැට්‍රොලැක්' උපකරණයෙන් ගණන් ගනු ලැබේ. එම මැණීමේ වැරදි පිළිබඳ පැමිණිල්ලක් ඇතොත්, එය පළමුව පාලක කමිටුවට දැනුම් දිය යුතුය. ඔවුන් එයට අවශ්‍ය පියවර නොගතහොත්, එය මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. එවිට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් හෝ කිහිපදෙනෙක් හෝ ඒ චෝදනා පිළිබඳව පරීක්ෂා කර බලා පරීක්ෂණ ප්‍රතිඵල පාලක කමිටුවට දන්වනු ලැබේ. අවශ්‍ය වුවහොත් 'මැට්‍රොලැක්' උපකරණයේ ප්‍රමාණයන් දැක්වෙන සටහන් පත්‍රය සංශෝධනය කිරීම සඳහා කටයුතු යොදනු ඇත.

5. ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නිලධාරීන්ට හැර වෙනත් කිසිම කෙනෙකුට එම සටහන් පත්‍රය වෙනස් කිරීමට අයිතියක් නැත. එම නිලධාරීන් වුවද, එසේ කරනුයේ පරීක්ෂණය සඳහා කිරි මිදවීමේ අත්හදා බැලීම් වලින් ලබා ගන්නා තොරතුරු අනුව හෝ ඒ සම්බන්ධ වෙනත් තොරතුරු අනුසාරයෙනි.

6. පාලන කමිටුවේ අනුමැතිය නොමැතිව කිසිම සාමාජිකයෙකු හෝ කළමනාකාර තැන හෝ අත්හදාබැලීමේ පරීක්ෂණ සඳහා කිරි මිදවීම් නොකළ යුතුය.

7. දිනපතා ලැබෙන කිරි සහ ඒවායේ වියළි බර දැක්වෙන සටහන් 'කිරි ගණන් පොතක' තබාගත යුතුය. දිනපතාම වැඩ අවසානයේදී, තැටි වල ඇති ෂීට් ප්‍රමාණයද ගණන් ගත යුතුවේ.

8. සාමාජිකයින් විසින් ගෙන එනු ලබන කිරි සඳහා මුදල් ගෙවීම සාමාජිකයන්ගේ කැමැත්ත අරිදි සතියකට වරක් හෝ දෙසතියකට වරක් හෝ මසකට වරක් කරනු ලැබේ.

9. කිරිවල වටිනාකමෙන් අඩක්වත් පලමු වරට ගෙවිය යුතුය. ඉතිරි මුදල් ගෙවනුයේ රබර් අලෙවි කිරීමෙන් පසුවය. පෙණ ෂීට් හැර ඉතිරි ෂීට් අලෙවියෙන් ලබාගත් මුදල් අලෙවි කරන ලද රබර් රාත්තල් ප්‍රමාණයෙන් බෙදු රාත්තලක සාමාන්‍ය මිළ ලබා ගත යුතුය. ඉන්පසු එම මිලෙන් නියම කරන ලද නිෂ්පාදන වියදම, රබර් පර්යේෂණායතනයට ගෙවිය යුතු ණය වාරිකය, සමිතියේ අරමුදල් සඳහා අඩු කිරීම ආදිය කර, ඉතිරි මුදල් රාත්තල් ප්‍රමාණය අනුව සාමාජිකයනට ගෙවිය යුතුය.

10. මධ්‍යස්ථානයේ රබර් අලෙවිය සඳහා ගෙනයාමේදී කළමනාකාර තැන් සමග පාලක කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙක් (මින් කෙනෙකු භාණ්ඩාගාරික මහතා විය යුතුය.) රබර් ගබඩාවට යා යුතුය.

11. සාමාන්‍ය නිෂ්පාදන වියදම් රාත්තලකට ශත 16–18 අතර විය යුතුය. මෙම ප්‍රමාණයන් අතර නිෂ්පාදන වියදම තබා ගැනීමට සෑම කමිටුවක්ම උත්සාහ ගත යුතුය. නිෂ්පාදන වියදම් ගාස්තු වැඩි කිරීමට අවශ්‍ය වුවහොත් ඒ බව අපහට දන්විය යුතු අතර, ඒ පිළිබඳ අපගේ උපදෙස් ලබා නොගෙන ගාස්තු වැඩි කිරීමක් නොකළ යුතුය.

12. රාත්තලකට ශත 02 බැගින් හෝ ගිවිසුමේ සඳහන් ප්‍රමාණය අනුව හෝ ණය වාරිකයන් හා පොලී වශයෙන් අඩු කරගත් මුදල මෙම දෙපාර්තමේන්තුව මගින් රබර් පර්යේෂණායතනයට මාසිකව ලැබීමට සැළැස්විය යුතුය. එම මුදල් සඳහා ලදුපත් රබර් පර්යේෂණායතනයේ ගිණුම් අංශය විසින් නිකුත් කරනු ඇත.

13. වැදගත් දැන්වීම් ප්‍රදර්ශනය සඳහා දැන්වීම් පුවරුවක් සෑම මධ්‍යස්ථානයකම තිබිය යුතුය. රබර් අලෙවි කිරීමෙන් පසුව ඉන් ලැබුණු මුදල, සම්පූර්ණ වියදම, රාත්තලක් සඳහා නිෂ්පාදන වියදම, සාමාජිකයනට රබර් රාත්තලකට ගෙවන ලද ප්‍රමාණය ආදී විස්තර එම දැන්වීම් පුවරුවෙහි දක්වා තැබිය යුතුය.

14. නිතර නිතර මුදල් පරිහරණය මඟ හැරීම පිණිස පුළුවන් කමක් ඇති සෑම මධ්‍යස්ථානයකම, ආසන්නව ඇති බැංකුවේ සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයේ නමින් ගිණුමක් ඇරඹීම කළ යුතුය. එසේ ආරම්භ කරන ලද ගිණුමෙන් මුදල් ආපසු ගැනීම අවශ්‍ය වූ විට සමිතියේ සභාපති හෝ ලේකම් යන අයවලුන්ගෙන් කෙනෙකුද, භාණ්ඩාගාරිකද යනුවෙන් දෙදෙනෙකු විසින් එම ආපසු ගැනීම් සඳහා අත්සන් කළ යුතු වන්නේය.

15. සෑහෙන ඉහළ මිළක් පවතින අවස්ථාවක සතියකට වරක් හෝ මසකට වරක් රබර් අලෙවි කළ යුතුය. වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ රජයේ රබර් ගබඩාවකට හෝ රබර් වලට සෑහෙන මුදලක් දෙනු ලබන පෞද්ගලික වෙළෙන්දෙකුට හෝ රබර් අලෙවි කිරීමට ඉඩ ඇත.

16. සියයට අනූවක් පමණ උසස් වර්ගයට (දු. දු. රෝ. නො. 1) ගැනෙන රබර් නිෂ්පාදනය කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

17. සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන වල ගණන් හිලව්, කමිටුව විසින් හැකි සෑම විටම අඩුවශයෙන් මසකට වරක්වත් පරීක්ෂා කළ යුතුය. විශේෂයෙන් මසකට වරක් හෝ දෙවරක් පමණ නිෂ්පාදනය කරන ලද ෂීට් ප්‍රමාණය පොත් පත්වල තිබෙන ප්‍රමාණය සමඟ සසඳා බැලිය යුතුය.

18. මෙම දෙපාර්තමේන්තුවෙන් සපයා ඇති ආකෘති පත්‍රය පරිදි මාසික විස්තර සටහනක් සෑම මසකම මෙහි ලැබීමට සැළැස්විය යුතුය.

19. මධ්‍යස්ථානවල ගිණුම් පරීක්ෂණ හයමසකට වරක් අප නිලධාරීන් විසින් කිරීමට කටයුතු සංවිධානය කරනු ලැබේ. ගණන් තැබීමේ ක්‍රමය ක්‍රමවත් කිරීම පිළිබඳ යෝජනා ආදියද ඔවුන් විසින්ම කරනු ඇත.

20 උසස් වර්ගයේ (දු.දු.රෝ.නො. 1) ෂීට් නිෂ්පාදනය කිරීමේ සියයට ප්‍රමාණය වැඩි කර ගැනීම සහ එහි නිෂ්පාදිත රබර් තැන්පත් (ගබඩා) කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙලද මේ සමඟ දක්වා ඇත.

## ආ. සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානවල රබර් නිෂ්පාදනය දියුණු කිරීම

සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන වල නිපදවනු ලබන රබර් ෂීට් වල තත්වය වැඩි දියුණු කිරීමේ අදහසින් ඊට මඟ පෙන්වන වැදගත් කරුණු කීපයක් මෙහි පළ කරමු.

1. උසස් වර්ගයේ දුම්ගැසූ දුර රොටි නිපදවීම (ආර්.එස්.එස්.) සඳහා සෑහෙන පමණ පිරිසිදු වතුර තිබිය යුතුය. වතුර ලබා ගැනීම අපහසු මධ්‍යස්ථානවල සාමාජිකයන් වතුර බාල්දි කිහිපයක් බැගින් ගෙනැවිත් දී ප්‍රධාන වතුර ටැංකිය පිරවීමට උදව් දිය යුතුය.

2. මැට්‍රොලැක් උපකරණයෙන් මැන ගැනීම පිණිස රබර් කිරි වලට 1:2 අනුපාතයට වතුර එකතුකළ යුතුය.

3. රබර් කිරිවල ප්‍රමාණය මැනීමේදී මිනුම් කෝදුව ඇදට නොව හරි කෙළින් තිබිය යුතුය.

4. කිරි එකට කළවම් කිරීමට පෙර 'මොනල්' දැල්ගැසූ පෙරහණකින් දෙවරක් පෙරා ගත යුතුය.

5. කිරිවල කහට ඇති අවස්ථා වලදී එකට කළවම් කරන ලද කිරි ගැලුම් 33කට අවුන්ස එකක් වනසේ 'සෝඩියම් බයි සල්පයිට්' මිශ්‍ර කළ යුතුය.

6. නියමාකාර ලෙස කිරි හොඳින් කලතා පෙණ ඉවත් කළ යුතුය.

7. පෝමික් අම්ලය (ඇසිඩ්) එක් කොටසකට වතුර කොටස් 89ක් වනසේ කළවම් කරගත් ඇසිඩ් මිශ්‍රණයක් සාදගත යුතුය.

8. ගැලුමකට අවුන්ස 8 – 10 ක් වන පරිදි කිරි වත්කළ සෑම තැටියකටම මෙම ඇසිඩ් මිශ්‍රණය යොද හොඳින් කලතා පෙණ ඉවත් කළ යුතුය.

9. කිරි මුදවන තැටි වලට කුණු රොඩු ආදිය නොවැටෙන පරිදි ඒවා වසා තැබිය යුතුය.

10. රෝල් කිරීමට පෙර කිරි තැටිය තලන මේසය මත දමා සැහෙන ඝනකමකට පත්වනතුරු එය තලා ගත යුතුය.

11. රෝල් අතර පරතරය එක් එක් වරට අඩුවන පරිදි තලන ලද කිරි කැටිය දිය රෝලෙන් තෙවරක් අඹරා ගත යුතුය.

12. අවශ්‍ය පරතරය කුමක්දැයි සොයා බලා අවශ්‍ය පරතර දක්වෙන පරිදි එය සකස් කිරීමට උපයෝගී කර ගන්නා රෝල් මුදුනත ඇති ඇණයෙහි සලකුණ යොද ගත හැක.

13. දිය රෝලෙන් තෙවරක්ද, 'ඩයමන්ඩ්' රෝලෙන් එක්වරක්ද, රෝල් කර ගත් පසු එම ෂීට් පිරිසිදු වතුරෙන් සෝද දුම් කාමරයට දැමීමට පෙර පැය දෙකක් පමණ කාලයක් වතුර බේරී යාමට ඉඩ හල යුතුය.

14. පළමු දවසේ දෙවරක්ද, ඉන්පසුව දිනකට එක්වරක්ද, බැගින් ෂීට් කරකැවිය යුතුය.

15. පැය 4–5 ක පරතරයක් ඇති වන පරිදි එක් වරකට දර ස්වල්පයක් බැගින් යොද දිනකට 3–4 වරක් දුම් කාමරය ගිනි දැල්විය යුතුය.

16. අලෙවිය සඳහා රබර් ෂීට් ඇසිරීමට පෙර ෂීට් වල දුම් නොගැසුණු තැන්, කුණු පැල්ලම් ඇති තැන්, ආදිය කපා ඉවත් කොට, ෂීට් වර්ග කළ යුතු අතර, එසේ වර්ග කරන ලද ෂීට් මිටියක 50 බැගින් වනසේ මිටි වලට බැඳිය යුතුය.